චක්‍රලේඛ අංකය : 10/2005

මගේ අංකය : එම්.13/01/2005

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක : 280, කෙළිපත් වීදිය,
කොළඹ 11.

2005, අගෝස්තු මස 25 වැනි දින.

සියලුම ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීම

අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීම සඳහා සකස් කරන ලද 2005 අංක 17 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත දැන් ක්‍රියාත්මකය. එකී පනතේ පිටපතක් මේ සමඟ එවමි. එකී පනත කොටස් දෙකකින් සමන්විතය. එනම් ;

I. ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම් හේතුවෙන් අතුරුදහන් හැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම. (පනතේ I කොටස)

II. ස්වාභාවික ව්‍යසන හෝ විපත්ති හේතුවෙන් අතුරුදහන් හැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම. (පනතේ II කොටස)

02. මේ අනුව එකී පනතේ 2 හා 10 වගන්ති අනුව අතුරුදහන් වූ අයගේ මරණ ලියාපදිංචි කිරීමට අදාළ අයදුම්පත් දැන් ඔබට භාරගත හැකි බව කාරුණිකව දන්වමි. ඒ අනුව, අයදුම්පත් සම්බන්ධව පහත සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන්න.

### ත්‍රස්තවාදී හෝ රාජ්‍ය විරෝධී ක්‍රියාකාරකම් හෝ ජන කැළඹීම් හේතුවෙන් අතුරුදහන් හැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම :

I. අයදුම්කරු :

මෙම පනත යටතේ මරණ ලියාපදිංචි කිරීම සඳහා අයදුම් කළ යුත්තේ මියගිය බවට විශ්වාස කරන පුද්ගලයාගේ ළඟම ඥාතියෙකු විසිනි.

II. <u>අයදුම් කළ යුතු ආකාරය :</u>

අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වන්නේ ඉහත කී පණතේ උප ලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ආකෘතියට අනුකූලවය. එම අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ, මියගිය බවට විශ්වාස කරන තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙතය. මෙම අයදුම්පත් සමඟ එම තැනැත්තා මියගොස් ඇති බවට විශ්වාස කිරීමට ඇති හේතු සඳහන් කරමින් විධිමත් ලෙස සකස් කළ දිවුරුම් ප්‍රකාශයක් ද, එකී තැනැත්තා අවුරුදු එකකට වැඩි කාලයක් ජීවතුන් අතර සිටිනු තමා දැක නැති බව හෝ අසා නැති බව ස්ථිර කරමින්, ඒ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයා ගෙන් ලබාගත් වාර්තාවක් සහ මෙම ඉල්ලීම තහවුරු කෙරෙන වෙන යම් ලිඛිත සාක්ෂි ඇත්නම් ඒවා ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

393 වන අධිකාරය වූ පරීක්ෂණ කොමිෂන් සභා පණත යටතේ පත්කරනු ලබන කොමිෂන් සභාවක් විසින් හෝ 1978 අංක 07 දරණ විශේෂ ජනාධිපති කොමිෂන් සභා පණත යටතේ පත්වූවන ලද විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් කිසියම් තැනැත්තෙකු අතුරුදහන් වී ඇති බවට සොයා දැනගනු ලැබූ අවස්ථාවක දී එකී පරීක්ෂණ කොමිෂන් සභාවේ හෝ විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ තීරණයේ සහතික කළ පිටපතක් ද අයදුම්පතට අමුණා ඉදිරිපත් කළ හැකිය.

III. <u>අයදුම්පත් මත ක්‍රියා කිරීම :</u>

(අ) ඉහත කී ආකාරයෙන් අයදුම්පත් ප්‍රාදේශීය ලේකම්වරයා / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වරයා වෙත ලැබුණු පසු, එම ඉල්ලීමේ පිටපතක් ඔහුගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ද, මියගිය බවට විශ්වාස කරන තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර පදිංචිය තිබුණු ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීවරයාගේ කාර්යාලයේ ද සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කළ යුතු වේ. මෙම දැන්වීම පළමු වරට ප්‍රදර්ශනය කළ දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී මෙම ඉල්ලීමට අදාළ වන තැනැත්තාගේ මරණය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුට විරෝධතාවයක් පළ කිරීමට ඇත්නම් ඒ සඳහා හේතු පැහැදිලි කරමින් සකස් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශයක් මඟින් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(ආ) ප්‍රාදේශීය ලේකම්වරයා / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු ඉහත කී විරෝධතාවයන් සම්බන්ධයෙන් සළකා බැලීමෙන් පසුව ද, ප්‍රාදේශීය ලේකම්වරයා / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු විරෝධතාවයක් පිළිබඳව පරීක්ෂා කිරීමෙන් ඉක්බිතිව, ඔහු විසින් සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාව ලැබීමෙන් පසුව ද සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් එකී මරණය ලියාපදිංචි කිරීම සුදුසු යැයි තීරණය කළහොත් එම තැනැත්තාගේ මරණය ලියාපදිංචි කිරීම සඳහා ඔහු අවසන් වරට පදිංචිව සිටි ස්ථානය අයත් වන, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ රෙජිස්ට්‍රාර් වෙත නියෝග කළ යුතුය. එකී රෙජිස්ට්‍රාර්වරයා එම මරණය විධිමත් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව, අයදුම්පතේ සඳහන් අයදුම්කරු වෙත නොමිළයේ නිකුත් කළ යුතු මරණ සහතිකය ලැබීමට සැළැස්විය යුතුය.

## 03. ස්වාභාවික ව්‍යසන හෝ විපත්ති හේතුවෙන් අතුරුදහන් වූ තැනැත්තන්ගේ මරණ ලියාපදිංචි කිරීම :

මුළු ලංකාවටම හෝ ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවලට හෝ ජීවිත හෝ දේපළ හානි සිදුකළ ජාතික මට්ටමින් බැරෑරුම් විපාක ඇති කළ ස්වාභාවික ව්‍යසනයක් හෝ විපත්තියක් සිදු වී ඇති අවස්ථාවක ඒ ව්‍යසනයට හෝ විපත්තියට ගොදුරු වූ නගර හෝ පරිපාලන දිස්ත්‍රික්කයක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් "ජාතික ව්‍යසනයට පාත්‍ර ප්‍රදේශයක්" බවට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. සුනාමි ඛේදවාචකයට භාජනය වූ ප්‍රකාශිත ප්‍රදේශවල නාම ලේඛණයක් මේ චක්‍රලේඛයට අමුණා ඇත.

### I. අයදුම්කරු :

ඉහත සඳහන් කළ ජාතික ව්‍යසනයක දී අතුරුදහන් තත්ත්වයට පත් වූ තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ ළඟම ඥාතියෙකු විසින් හෝ පවුලේ එවැනි ඥාතියෙකු එම ව්‍යසනයෙන් දිවි ගලවාගෙන නොමැති අවස්ථාවක එම අතුරුදහන් වූ අය පිළිබඳව දන්නා තැනැත්තෙකු හෝ එසේ අතුරුදහන් වී ඇති බවට තරයේ විශ්වාස කරන තැනැත්තෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

II. අයදුම් කළ යුතු ආකාරය :

ඉහත කී තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත සමග මියගිය බවට විශ්වාස කරන තැනැත්තා අතුරුදහන් වූ හේතු කාරණා පෙන්නුම් කරන දිවුරුම් ප්‍රකාශයක් ද, මියගිය බවට විශ්වාස කරන තැනැත්තා පුරුද්දක් වශයෙන් වාසය කළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

III. අයදුම්පත් මත ක්‍රියා කිරීම :

අයදුම්පත් ග්‍රාම නිලධාරීවරයා වෙත ලැබුණු විට එම අයදුම්පත්‍රය නිර්දේශ කර ප්‍රකාශිත කරුණුවල ඔහුගේ උපරිම දැනීමේ ප්‍රමාණයට නිරවද්‍යතාවය සහතික කරන වාර්තාවක් ද සමග එම ග්‍රාම නිලධාරී වසම අයත් වන ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා / අතිරේක රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම ප්‍රාදේශීය ලේකම්වරයා ඒ සෑම අයදුම්පතක්ම පරීක්ෂා කර රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කලාප කාර්යාලය භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත නොපමාව ඉදිරිපත් කළ යුතුය. එකී සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ඉහත කී ලියවිලි පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසුව එකී මරණ ලියාපදිංචි කිරීම සඳහා නියෝගයක් ලබාදී මියගිය බවට විශ්වාස කරන අය පුරුද්දක් වශයෙන් පදිංචි සිටි ප්‍රදේශය අයත් වන කොට්ඨාශයේ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර්වරයා එකී මරණය විධිමත් ලෙස ලියාපදිංචි කිරීමෙන් පසුව, අයදුම්පතෙහි සඳහන් අයදුම්කරුගේ නමට නොමිලයේ නිකුත් කළ යුතු මරණ සහතිකය ලැබීමට සැලැස්විය යුතුය.

04. විදේශිකයින්ගේ මරණ ලියාපදිංචි කිරීම :

විදේශිකයෙකු ශ්‍රී ලංකාවට පැමිණ සිටියදී ඉහත සඳහන් කළ ස්වාභාවික ව්‍යසනයන් නිසා අතුරුදහන් වී ඇති බවට සාක්ෂ්‍ය ඇති අවස්ථාවක ඒ තැනැත්තා සඳහා මරණ සහතිකයක් තමා වෙත නිකුත් කරවා ගැනීම පිණිස ඒ පිළිබඳව දැනීමක් ඇති ඕනෑම අයෙකුට ඉල්ලීමක් කළ හැකිය. ඒ සෑම අයදුම්පතක් ම මියගිය බවට විශ්වාස කරන තැනැත්තා පුරවැසියෙකුව සිටි රට වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිටින තානාපතිවරයා හෝ කොන්සල්වරයා සහතික කර, එම අයදුම්පත්‍රය කෙළින්ම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් එකී මරණ ලියාපදිංචි කිරීම සඳහා විධි විධාන සළස්වනු ලැබේ.

**ප්‍රාදේශීය ලේකම්වරුන් / දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් අයදුම්පත් යොමු කළ යුතු කලාප කාර්යාලවල ලිපිනයන් පහත සඳහන් වේ. :**

01. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
දකුණු කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොටුව,
ගාල්ල.

02. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
බස්නාහිර කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

03. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
වයඹ උතුරු මැද කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
වත්හිමි පාර,
කුරුණෑගල.

04. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
ඌව සබරගමු කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නව නගරය,
රත්නපුර.

05. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
උතුරු නැගෙනහිර කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
මඩකලපුව / යාපනය.

06. සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,
මධ්‍යම කලාප කාර්යාලය,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
මහනුවර.